සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 **63 S I**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

කාලය පැය තුනයි

උපදෙස් :
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2),(3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(01) ව්‍යවසායකත්ව අධ්‍යයනය හදාරන සිසුන් තිදෙනෙකු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ කිහිපයක් පහත වේ.
A - ව්‍යවසායකත්වය (සිතන, තර්ක කරන සහ ක්‍රියා කරන ආකාරයකි.)
B - ව්‍යවසායකත්වය (පුද්ගලයින්ගේ ආකල්ප, හැසිරීම් සහ කුසලතා පිළිබඳ එකතුවකි.)
C - ව්‍යවසායකත්වය (මිනිස් චින්තනය හා බැඳුණකි.)
ඉහත ප්‍රකාශ අතුරින් ව්‍යවසායකත්වය අර්ථ දැක්වීමේදී වැදගත් වන ප්‍රකාශය / ප්‍රකාශන වනුයේ
1.A පමණි. 2.A හා B පමණි. 3.C පමණි. 4.A හා C පමණි.

(02) මුහුණ දෙන ගැටලුව හා අවස්ථාව උදෙසා ඒවාට ප්‍රශස්ථ විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණය,
1.සුභවාදී වීම වේ. 2.ස්වාධීනත්වය වේ. 3.නිර්මාණශීලීත්වය වේ. 4.අනාගත දැක්ම වේ.

(03) දැනටමත් පවතින නිෂ්පාදිතයකට හෝ ක්‍රියාවලියකට නව භාවිතයක් ඇති කිරීමේ නවෝත්පාදන ශිල්පීය ක්‍රමය,
1.සංකලනයකි. 2.දිගුවකි. 3.නව සොයාගැනීමකි. 4.අනුකරණයකි.

(04) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1.මිනිස් අවශ්‍යතා තුළින් මිනිස් වුවමනා නිර්මාණය වේ.
2.මිනිස් වුවමනා සෑම අයෙකුටම පොදු වේ.
3.මිනිස් අවශ්‍යතා සංකීර්ණ වේ.
4.මිනිස් වුවමනා සහ මිනිස් අවශ්‍යතා ව්‍යාපාරිකයින් විසින් නිර්මාණය කරයි.

(05) ආයතනයක විවිධ පාර්ශ්ව අතර තොරතුරු බෙදාහැරීම, රැස් කිරීම හා ක්‍රමානුකූලව වාර්තා කිරීම ව්‍යවසායෙකුගේ ........Ⓐ.......... කුසලතාව වේ.
මෙහි Ⓐ හිස්තැන පිරවීමට සුදුසු වචනය වනුයේ,
1.තාක්ෂණික. 2.සංකල්පනාත්මක. 3.සන්නිවේදන. 4.උපදේශන.

(06) ආයතනයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ව්‍යවසායකයාට,
1.ශක්තීන් හා අවස්ථා හඳුනාගත හැක 2.අවස්ථා හා තර්ජන හඳුනාගත හැක.
3.දුර්වලතා හා ශක්තීන් හඳුනාගත හැක. 4.තර්ජන හා දුර්වලතා හඳුනාගත හැක.

(07) වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ තොග හා සිල්ලර වෙළඳාමත්, ඊට අවශ්‍ය උපකාරක සේවා ද සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතී. මේවා ආර්ථිකයක,
1.කාර්මික අංශය නියෝජනය කරයි. 2.ප්‍රාථමික අංශය නියෝජනය කරයි.
3.කෘෂිකාර්මික අංශය නියෝජනය කරයි. 4.තෘතීයික අංශය නියෝජනය කරයි.

(08) නව ව්‍යවසායකයෙකු නව නිෂ්පාදිතයක් නව වෙළඳපලකට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි. මෙම ප්‍රවේශය පිළිබඳ නිවැරදි නොවන වගන්තිය කවරේද?
1.සැළසුම් වලින් තොරව කටයුතු කළහැකි වීම. 2.තරඟකරුවන් නොමැති වීම.
3.ඉහළ අවදානමක් පැවතීම. 4.නිවැරදිව වෙළඳපල අධ්‍යයනය කළ යුතු වීම.

(09) ව්‍යවසායකයින් වන රංග සහ සුරංග නව නිෂ්පාදිත 2ක් මෙසේ ඉදිරිපත් කොට ඇත.
රංග - සීනි රහිත රසකැවිලි නිපදවීම.
සුරංග - පැරණි ගොඩනැගිලි නවීන ක්‍රම ශිල්පවලට අනුව ප්‍රතිසංස්කරණය කිරීම.
SCAMPER ආකෘතියට අනුව රංග සහ සුරංග නව නිෂ්පාදිත ඉදිරිපත් කිරීමට භාවිත ක්‍රමවේද පිළිවෙලින්,
1.ආදේශ කිරීම හා ඉවත් කිරීම වේ. 2.ඉවත් කිරීම හා යළි සකස් කිරීම වේ.
3.යළි සකස් කිරීම හා සම්බන්ධ කිරීම වේ. 4.සම්බන්ධ කිරීම හා කුඩා කිරීම වේ.

(10) ව්‍යවසායකයෙකුට හොඳ ව්‍යාපාර අවස්ථාවක් උදාකරගත හැකි වනුයේ ව්‍යාපාර අදහස් තුළිනි. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයක් නොවනුයේ,
1.පරිසරයෙන් මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම. 2.තරඟකාරිත්වයට සාර්ථකව මුහුණදිය හැකි වීම.
3.පහසුවෙන් වෙළෙඳපොලට ඇතුළත් විය හැකිවීම. 4.තාක්ෂණය සමඟ ගැළපිය හැකිවීම.

(11) හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ ක්‍රියාවළිය අනුපිළිවෙලින් නිරූපණය කරන පිළිතුර තෝරන්න.
1.සූක්ෂම විශ්ලේෂණය ⟶ සාර්ව විශ්ලේෂණය ⟶ ශඳුඅත විශ්ලේෂණය
2.සාර්ව විශ්ලේෂණය ⟶ ශඳුඅත විශ්ලේෂණය ⟶ සූක්ෂම විශ්ලේෂණය
3.ශඳුඅත විශ්ලේෂණය ⟶ සූක්ෂම විශ්ලේෂණය ⟶ සාර්ව විශ්ලේෂණය
4.සාර්ව විශ්ලේෂණය ⟶ සූක්ෂම විශ්ලේෂණය ⟶ ශඳුඅත විශ්ලේෂණය

(12) ව්‍යාපාර අදහස් සමඟ සසඳන කළ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි වෙනස්කමක් නොවන්නේ,
1.ව්‍යාපාර අවස්ථා සුලභ නොවීම.
2.ව්‍යාපාර අවස්ථා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි වීම.
3.ව්‍යාපාර අවස්ථා සීමිත වීම.
4.ව්‍යාපාර අවස්ථා සෑමවිටම නොවීම.

(13) නිමල් සහ සුනිමල් ලියූ රචනා දෙකක මාතෘකා පහත වේ.
නිමල් - ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සහ එහි සංයුතිය.
සුනිමල් - ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මිල මට්ටම වෙනස් වීම හා උද්ධමනය.

ඉහත මාතෘකා ඇතුළත් වන ව්‍යාපාර බාහිර පරිසර සාධක පිළිවෙලින්,
1.දේශපාලන පරිසරය හා තාක්ෂණික පරිසරය. 2.ප්‍රජා පරිසරය හා ආර්ථික පරිසරය.
3.ආර්ථික පරිසරය හා දේශපාලන පරිසරය. 4.තාක්ෂණික පරිසරය හා ප්‍රජා පරිසරය.

(14) ශ්‍රී ලංකාව තුළ කුඩා ව්‍යාපාර සාර්ථකව පවත්වාගෙන යාමට හේතුවක් වී තිබෙන්නේ,
1.ගණුදෙණු නිවැරදිව වාර්තා කිරීම.
2.ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම් ලැබීම.
3.තම ශක්ති ප්‍රමාණයෙන් ව්‍යාපාරය ආරම්භ කොට පවත්වාගෙන යාම.
4.ව්‍යාපාර කටයුතු නිවැරදිව සැළසුම් කිරීම.

(15) සංකල්ප, ප්‍රදේශයේ දිළිඳුකම තුරන් කිරීමට නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන් පුද්ගලයෙකු වන බැවින්, ඔහු,
1.සමාජයීය ව්‍යවසායකයෙකි 2.ආයතනික ව්‍යවසායකයෙකි.
3.ව්‍යාපාර ව්‍යවසායකයෙකි. 4.ගෝලීය ව්‍යවසායකයෙකි.

(16) නව සොයා ගැනීමක් වෙනුවෙන් රජයෙන් ලබාගන්නා පේටන්ට් බලපත්‍රයක වලංගු කාලසීමාව,
1.අවුරුදු 05 යි. 2.අවුරුදු 10 යි. 3.අවුරුදු 15 යි. 4.අවුරුදු 20 යි.

(17) ව්‍යාපාර සැළසුමක් සම්බන්ධ ප්‍රකාශන කිහිපයක් පහත වේ.
A-ව්‍යාපාර සැළසුමක සංක්ෂිප්තය විධායක සාරාංශය මගින් නිරූපණය වේ.
B-ව්‍යාපාර සැළසුමක වැදගත්ම මූලිකාංගය මූල්‍ය සැළසුම වේ.
C-ව්‍යාපාරයක සාර්ථකත්වයට ව්‍යාපාර සැළසුම පිටිවහලකි.

ඉහත ප්‍රකාශන අතුරින්, කවර ප්‍රකාශ/ප්‍රකාශන ව්‍යාපාර සැළසුමක් සම්බන්ධයෙන් වලංගු වේද?
1.A පමණි. 2.C පමණි. 3.A හා C පමණි. 4.B හා C පමණි.

(18) අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1.නිෂ්පාදිතය, ප්‍රවර්ධනය, මිල හා ස්ථානය. 2.ප්‍රවර්ධනය, මිල, ඉල්ලුම හා නිෂ්පාදිතය.
3.මිල, නිෂ්පාදිතය, ස්ථානය හා සැපයුම. 4.සැපයුම, මිල, නිෂ්පාදිතය හා ඉල්ලුම.

(19) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙණු කිහිපයක් පහත වේ.

| | |
|---|---|
| විකුණුම් ආදායම් | රුː 100, 000 |
| යන්ත්‍ර ගැනීම් | රුː 50, 000 |
| ණයගැති ලැබීම් | රුː 75, 000 |
| යන්ත්‍ර ක්ෂයවීම් | රුː 10, 000 |

ව්‍යාපාරයේ මුදල් ගලාඒම් සහ මුදල් ගලායෑම් වටිනාකම පිළිවෙලින්,
1.රුː 100, 000 හා රුː 50, 000 කි. 2.රුː175, 000 හා රුː 50, 000 කි.
3.රුː 100, 000 හා රුː 60, 000 කි 4.රුː175, 000 හා රුː 60, 000 කි.

(20) නිෂ්පාදන සැළසුමක් පිළියෙල කිරීමේදී සලකා බලනු ලබන කරුණු ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1.නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදන බෙදාහැරීම, නිෂ්පාදන පිරිවැය.
2.නිෂ්පාදන බෙදාහැරීම, නිෂ්පාදන ස්ථාවර වත්කම්, ඒකක පිරිවැය.
3.නිෂ්පාදන ස්ථාවර වත්කම්, නිෂ්පාදන පිරිවැය, ඒකක පිරිවැය.
4.නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදන ප්‍රවර්ධනය, නිෂ්පාදන පිරිවැය.

(21) ව්‍යාපාරයක් සැකසූ පරිපාලන සැළසුමේ ඇතුළත් අයිතම කිහිපයක් පහත වේ.
A-කාර්යාල උපකරණ C-රක්ෂණ ගාස්තු
B-කාර්යාල උපකරණ ක්ෂය D-ගොඩනැගිලි හා සවි කිරීම්
ඉහත අයිතමයන් හී ස්ථාවර පරිපාලන ස්ථාවර වත්කම් නිරූපණය වනුයේ,
1.A හා B මගිනි. 2.B හා C මගිනි. 3.C හා D මගිනි. 4.D හා A මගිනි.

(22) ඕනෑම ව්‍යාපාර සංවිධානයක දක්නට නොලැබෙන ලක්ෂණයකි,
1.නීතිමය පුද්ගලභාවයක් පැවතීම. 2.ආර්ථික කටයුත්තක නියැලීම.
3.සාමූහික සම්බන්ධතාවක් පැවතීම. 4.හිඟ සම්පත් භාවිතය.

(23) ව්‍යාපාරවලට බලපාන අණපනත් දෙකක් පහත වේ.
⋆ 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත ⋆ 2007 අංක 07 දරණ සමාගම් පනත
ඉහත අණපනත් දෙකම අදාළ විය හැකි ව්‍යාපාර වර්ගය වනුයේ,
1.කේවල ස්වාමි ව්‍යාපාර. 2.හවුල් ව්‍යාපාර. 3.සීමිත සමාගම්. 4.වරලත් ව්‍යාපාර.

(24) සීමිත සමාගමක් ආරම්භ කිරීම පිණිස ඉදිරිපත් කරන සාංගමික ව්‍යවස්ථාවලියේ අඩංගු නොවන තොරතුර කවරේ ද?
1.සමාගමේ පරමාර්ථ. 2.සමාගමේ ලියාපදිංචි අංකය.
3.සමාගමේ පරිපාලන තොරතුරු. 4.සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම්.

(25) සීමිත පෞද්ගලික සමාගම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1.අවම කොටස්කරුවන් සංඛ්‍යාව දෙකයි.
2.සමාගමේ කොටස් මිලදී ගැනීමට පොදු මහජනතාවට ආරාධනා කළ හැක.
3.සමාගමේ පාලනයට අවම වශයෙන් අධ්‍යක්ෂවරයෙක්වත් සිටිය යුතුය.
4.අඛණ්ඩ පැවැත්මක් නොමැත.

(26) පහත හඳුන්වනුයේ ව්‍යාපාර වර්ග කිපයකි.
A-කේවල ස්වාමි ව්‍යාපාර B-හවුල් ව්‍යාපාර
C-සීමිත සමාගම් D-වරලත් ව්‍යාපාර (සංස්ථාපිත සමාගමක් ලෙස සංවිධානය වූ)
ඉහත ව්‍යාපාර වර්ග අතුරින් නෛතික පුද්ගලභාවයක් හිමි ව්‍යාපාරවනුයේ,
1.A හා B. 2B හා C. 3.C හා D. 4.D හා A.

(27) වරලත් ව්‍යාපාරයක් ඇරඹීමේ ක්‍රියාවලිය නිවැරදිව නිරූපණය වන කාණ්ඩය තෝරන්න.
1.වරලත්හිමියා ⟶ වරලත් ගිවිසුම ⟶ වරලත් ලාභියා ⟶ වරලත් ව්‍යාපාර
2.වරලත්කරු ⟶ වරලත්ලාභියා ⟶ වරලත් ව්‍යාපාර ⟶ වරලත් ගිවිසුම
3.වරලත්හිමියා ⟶ වරලත් ව්‍යාපාර ⟶ වරලත් ගිවිසුම ⟶ වරලත්ලාභියා
4.වරලත්කරු ⟶ වරලත්ලාභියා ⟶ වරලත් ගිවිසුම ⟶ වරලත් ව්‍යාපාර

(28) ව්‍යවසායකයෙකුට තම අරමුණු ඉටුකර ගැනීමේදී යහපත් අයුරින් සේවකයින්ට මගපෙන්වීම, පුහුණුව හා සංවර්ධනය ලබාදීම, සේවකයින් අභිප්‍රේරණය කිරීම වැදගත් වේ. මෙම කාර්යභාරය අඩංගු වන්නේ ව්‍යවසායකයාගේ,
1.අයිතිකරුගේ භූමිකාවටය. 2.නායකයාගේ භූමිකාවටය.
3.ව්‍යවසායකත්ව භූමිකාවටය. 4.කළමණාකරුගේ භූමිකාවටය.

(29) ව්‍යාපාරිකයින් මෙන්ම, ව්‍යවසායකයින් ද ව්‍යාපාර කටයුතු වල නිරත වෙති. මෙම දෙපාර්ශවය අතර දැකිය නොහැකි සමානකමක් වනුයේ,
1.නීතිමය පුද්ගලභාවයක් පැවතීම. 2.වෙළඳපල තරඟයට මුහුණදීම.
3.ආර්ථික කටයුත්තක නියැලීම. 4.සම්පත් භාවිතා කිරීම.

(30) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ඇරඹිය හැකි ප්‍රධාන සමාගම් වර්ග,
1. 3 කි. 2. 4 කි. 3. 5 කි. 4. 6 කි.

(31) ව්‍යවසායකයින් අවදානම් දරමින් නවෝත්පාදනයන් හී නිරත වෙති. මෙවැනි නවෝත්පාදනයන් බිහිවීම පිණිස භාවිත මූලාශ්‍රයක් නොවියහැකිවනුයේ,
1.දැනුම මත පදනම් කරගත් සංකල්පයක්. 2.අනපේක්ෂිත සිදුවීමක්.
3.අනපේක්ෂිතව වෙළඳපල සැපයුම වැඩිවීමක්. 4.තේරුම් ගන්නා ආකාරය වෙනස්වීමක්.

(32) ව්‍යාපාරයක අවදානම හා ප්‍රතිලාභය අතර පැවතිය හැකි නිවැරදි සම්බන්ධතාව නිරූපිත වගන්තිය තෝරන්න.
1.අවදානම ඉහළ යනවිට, ප්‍රතිලාභය පහළ යනු ඇත.
2.අවදානම ඉහළ යන අනුපාතයට සමානව ප්‍රතිලාභය ද ඉහළ යනු ඇත.
3.අවදානම පහළ යනවිට ප්‍රතිලාභයද පහළ යනු ඇත.
4.අවදානම පහළ යන වේගයට වඩා වැඩි වේගයකින් ප්‍රතිලාභය ඉහළ යනු ඇත.

(33) ව්‍යාපාරිකයා සමඟ සසඳන කළ ව්‍යවසායකයෙකු සිදු නොකරන කාර්යයක් වනුයේ,
1.ගැටලුව නිර්මාණශීලීව විසඳා ගැනීම.
2.දිගුකාලීන දැක්මක් සහිතව කෙටි කාලීන ඉලක්ක ගොඩනගා ගැනීම.
3.තරඟය කැමැත්තෙන්ම සොයායාම.
4.ව්‍යාපාරය පුළුල්කර ගැනීම.

(34) ව්‍යාපාර පරිසරයේ ක්‍රියාකාරී බලවේග කිහිපයක් පහත වේ.
A-ගණුදෙණුකරුවන් B-සැපයුම්කරුවන් C-තරඟකරුවන් D-කළමණාකරුවන්

ඉහත බලවේග අතුරින් ආසන්න පරිසරයේ ක්‍රියාත්මක නොවන බලවේග වනුයේ,
1.A 2.B 3.C 4.D

(35) හවුල් ව්‍යාපාර සම්බන්ධ වගන්ති කිහිපයක් පහත වේ.
A -සාමුහික තීරණ ගතහැකි වීම.
B -වගකීම අසීමිත වීම.
C -ආරම්භ කිරීමේ පහසුව.
D -අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

හවුල් ව්‍යාපාරයක සීමා නිරූපනය වනුයේ,
1.A හා C මගිනි. 2.B හා D මගිනි. 3.A හා B මගිනි. 4.C හා D මගිනි.

*** පහත ඡේදය කියවා අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

"............ මට සැමවිටම අනාගතයේදී සැබෑ කර ගැනීමට තිබූ සිහිනයක් තිබුණා. මේ සඳහා ව්‍යවසායකයෙකු ලෙස පරිසරයේ ඇතිවන වෙනස්කම්වලට අනුගත වෙමින් සූදානම් වුණා. එසේම ආරම්භ කළ කුඩා ව්‍යාපාරය සඳහා යොදාගත හැකි සියලුම වාසිදායක සාධක භාවිත කළා. එපමණක් නොව ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස අවශ්‍ය සම්පත් යොදවමින්, අවදානම් දරමින්, වැදගත් තීරණ ගැනීම පවා සිදුකළා. එනිසා තමයි මට තරුණ - තරුණියන්ට මාගේ ව්‍යාපාරයේ රැකියා ලබාදීමට, පසුගිය සුනාමි දවස් වල විශාල පිරිසකට උදව් කිරීමට අවස්ථාව උදා වුණේ.............."

(36) "අනාගතයේදී සැබෑ කරගැනීමට තිබූ සිහිනය" යන ව්‍යවසායකත්ව ගතිලක්ෂණය හැඳින්වෙන්නේ,
1.නිර්මාණශීලිත්වය ලෙසයි.
2.අනාගත දැක්ම ලෙසයි.
3.සුභවාදී වීම ලෙසයි.
4.අසීරු අරමුණු ඉටුකර ගැනීමට ඇති නැඹුරුතාව ලෙසයි.

(37) "පරිසරයේ ඇතිවන වෙනස්කම්වලට අනුගත වෙමින් සූදානම් වීම" යන ව්‍යවසායකත්ව ගතිලක්ෂණය හැඳින්වෙන්නේ,
1.කැපවීම ලෙසයි. 2.ආත්ම විශ්වාසය ලෙසයි. 3.නම්‍යශීලිත්වය ලෙසයි. 4.දැඩි ආශාව ලෙසයි.

(38) කුඩා ව්‍යාපාර සඳහා යොදාගත හැකි සියලුම වාසිදායක සාධක හැඳින්වෙන්නේ,
1.ශක්තීන් ලෙසයි. 2.දුර්වලතා ලෙසය 3.ඉඩ ප්‍රස්ථා ලෙසයි. 4.අවකාශ ලෙසයි.

(39) අවශ්‍ය සම්පත් සැපයීම, අවදානම් දැරීම, වැදගත් තීරණ ගැනීම ආදිය ව්‍යවසායකයකුගේ,
1.අයිතිකරුගේ භූමිකාව නිරූපණය කෙරේ.
2.කළමණාකරුගේ භූමිකාව නිරූපණය කෙරේ.
3.පරිපාලකයාගේ භූමිකාව නිරූපණය කෙරේ.
4.නායකයාගේ භූමිකාව නිරූපණය කෙරේ.

(40) රැකියා ලබාදීම, සුනාමි ව්‍යසනයේදී විශාල පිරිසකට උදව් කිරීම ආදිය ව්‍යවසායකත්වයෙන්,
1.දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ වේ.
2.දේශීය ජනතාවට හිමිවන ප්‍රතිලාභ වේ.
3.ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ වේ.
4.ගෝලීය පරිසරයට හිමිවන ප්‍රතිලාභ වේ.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 63 S II |
|---|---|---|

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

උපදෙස් :
* පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

විදේශ අධ්‍යාපනය ලැබ මෙරටට පැමිණ සිටින නිමේෂ්, නිර්මාණශීලී තරුණයෙකි. නමුත් ඔහුගේ දෙමාපියන්ගේ පවුල් පරිසරය නිරීක්ෂණය කිරීමේදී විශ්වාසය හා ආකල්ප කෙරෙහි පවතින දැඩි බැඳීම, සෑම කාර්යයකදීම ක්ෂණිකව ක්‍රියා කිරීම වැනි තත්වයන් පෙන්නුම් කෙරේ. කෙසේ වුවත් කුඩා කළ සිටම ව්‍යවසායකයෙකු සතු ගතිලක්ෂණ නිරූපණය කළ ඔහු, සෑම දිනකම ගෙවත්තේ වැටී විනාශ වී යන වැල, වරකා සහ අඹ වැනි පලතුරු වේලා පැකට් කොට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහසින් කල්ගත කරන ලදී. පසුව ටික කලකදී පියුමී සමග විවාහ ගිවිස ගත් නිමේෂ්, දෙදෙනා සමග එකතු වී විවිධ ආයතන වෙත ගොස් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් යෝජිත ව්‍යාපාරය සඳහා ලබා ගන්නා ලදී. කෙසේ වුවත් අවසානයේදී යෝජිත ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට නිමේෂ් අදහස් කර සිටිය ද, පියුමී ප්‍රකාශ කළේ එය සීමිත පෞද්ගලික සමාගමක් ලෙස පවත්වාගෙන යාම වඩාත් සුදුසු බවයි.

i. ව්‍යවසායකයෙකු ලෙස නිමේෂ්ට තවත් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කොට පවත්වාගෙන යාමට සුදුසු නිෂ්පාදිත දෙකක් යෝජනා කරන්න.
ii. නිමේෂ්ගේ නිර්මාණශීලීත්වයට බාධක විය හැකි සාධක දෙකක් නම් කරන්න.
iii. ඇරඹීමට සුදුසු යෝජිත ව්‍යාපාරය සඳහා මූල්‍ය හා තාක්ෂණ සහාය ලබාගත හැකි රාජ්‍ය ආයතනය බැගින් නම් කරන්න.
iv. නිමේෂ් සතු ශක්තීන් මොනවාද?
v. හවුල් ව්‍යාපාරයකට වඩා සීමිත සමාගමක් ආරම්භ කිරීමේ වාසි කවරේද?

යොජිත ව්‍යාපාරය සඳහා ව්‍යාපාර විශ්ලේෂිකාවක් වූ (Business Analyst) නිමේෂ්ගේ සහකාරිය, පියුමී 2018 ජනවාරි මාසය සඳහා සැකසූ ව්‍යාපාර සැළසුමෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත වේ.

| අයිතමය | වටිනාකම (රු.) |
|---|---|
| ගොඩනැගිල්ල | 500,000 |
| පළතුරු මිලට ගැනීම | 125,000 |
| විදුලි ගාස්තු | 5,000 |
| ජල ගාස්තු | 2,000 |
| පලතුරු සැකසීමේ සේවක වැටුප් | 50,000 |
| යන්ත්‍ර | 200,000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 25,000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 10,000 |

<u>අතිරේක තොරතුරු</u>
- නිෂ්පාදන/අලෙවි කිරීමට යෝජිත පැකට් ගණන 5000යි
- පැකට් එකක විකුණුම් මිල රු: 100යි
- යන්ත්‍ර වාර්ෂිකව 12% බැගින් ක්ෂය වේ.

ඉහත තොරතුරු ඇසුරෙන්,
vi. මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
vii. මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.
viii. අපේක්ෂිත මුළු ආදායම ගණනය කරන්න.
ix. අපේක්ෂිත ශුද්ධ ලාභය/පාඩුව කොපමණද?
x. ව්‍යාපාරයේ මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම කොපමණද? (ලකුණු 2x10=20 යි)

02) අ. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ රජය යහපත් ව්‍යවසායකත්ව සංස්කෘතියක් ගොඩනැංවීමෙහි ලා අවශ්‍ය කටයුතු සම්පාදනය කොට පවත්වාගෙන යනු පෙනේ.
i. "ව්‍යවසායකත්ව සංස්කෘතිය" යන්න ඔබේ අදහස් වලින් දක්වන්න.
ii. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය ගැටලු **දෙකක්** නම් කොට, ව්‍යවසායකත්ව සංස්කෘතිය මගින් ඊට විසඳුම් ලබාගත හැකි ආකාරය කෙටියෙන් විමසන්න.

iii. යහපත් ව්‍යවසායකත්ව සංස්කෘතියක් ගොඩනැංවීමෙහිලා ශ්‍රී ලංකාව තුළ පැවතිය යුතු හිතකර සාධක **හතරක්** නම් කරන්න.

ආ. ශ්‍රී ලංකාව තුළ කාන්තා ව්‍යවසායකයින්ගේ භූමිකාව දිනෙන් දින සංවර්ධනය වීමේ ප්‍රවණතාවක් නිරූපණයවනු පෙනේ.

iv. කාන්තාවන්, ව්‍යවසායකයින් ලෙස මෙහෙයවන ව්‍යාපාර ක්ෂේත්‍ර **හතරක්** නම් කරන්න.

v. ඔවුන් විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සංවර්ධනය වීමෙහිලා, කාන්තාවන් තුළ පවතින ශක්තීන් **හතරක්** නම් කරන්න.

(ලකුණු 2 x 5 = 10යි)

(03) අ. රටක ආර්ථික හා සමාජයීය සංවර්ධනය උදෙසා ව්‍යවසාකයින්ගේ ගතිලක්ෂණ මෙන්ම කුසලතා ද එකසේ වැදගත් වේ.

i. ව්‍යවසායකත්ව ගතිලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

ii. සංකල්පනාත්මක කුසලතා යනු මොනවාද? උදාහරණ **දෙකක්** සපයන්න.

iii. ව්‍යවසායකත්ව ගතිලක්ෂණ හා කුසලතා වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** නම් කරන්න.

ආ. ව්‍යාපාර අදහස් දහස් ගණන් පැවතිය ද, ඒවායින් එකක් හෝ සාර්ථක කර ගනිමින් ව්‍යාපාර අවස්ථාවක් උදාකර ගැනීම ව්‍යවසායකුගේ කාර්යභාරය වේ.

iv. ව්‍යාපාර අදහසක් යනු කුමක් ද?

v. හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ මොනවා ද?

(ලකුණු 2 x 5 = 10යි)

(04) අ. ව්‍යාපාර පරිසරය නිතර වෙනස් වන සුළුය. එය නිරන්තරයෙන් අධ්‍යයනය කිරීම ව්‍යවසායකුගේ සාර්ථකත්වයට ඉවහල් වන කාර්යයකි.

i. අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය තුළ ක්‍රියාත්මක සාධක කවරේද?

ii. ස්වභාවික පරිසරය කෙටියෙන් විමසන්න. එහි ව්‍යාපාර අවස්ථාවක් උදාකර ගැනීම උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

iii. ව්‍යවසායකයෙකුට ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් අත්වන ප්‍රයෝජන කවරේද?

ආ. බොහෝ කුඩා ව්‍යාපාර, කේවල ස්වාමි ව්‍යාපාර සංවිධාන ක්‍රමය යටතේ ක්‍රියාත්මක වනු පෙනේ.

iv. කුඩා පරිමාණ ව්‍යාපාරවල ශක්තීන් **හතරක්** නම් කරන්න.

v. "සෑම කේවල ස්වාමි ව්‍යාපාරයක්ම ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ." ඔබ මීට එකඟ ද? විස්තර කරන්න.

(ලකුණු 2 x 5 = 10යි)

(05) අ. වෙළඳපොළ තරඟකාරිත්වය ඔස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග නිර්මාණය වී ඇත.

i. හවුල් ව්‍යාපාරයක "හවුල් ගිවිසුමෙහි" ඇතුළත් වියහැකි තොරතුරු **හතරක්** නම් කරන්න.

ii. පහත ශීර්ෂ ඔස්සේ හවුල් ව්‍යාපාරයක් සහ සීමිත පෞද්ගලික සමාගමක් සසඳන්න.

A - අවම හවුල්කරුවන් / කොටස්කරුවන් ගණන

B - බලපාන ප්‍රධාන පනත / ආඥාපනත

C - උපරිම හවුල්කරුවන් / කොටස්කරුවන් ගණන

D - පාලනය

පිළිතුරු සැපයීම පිණිස පහත වගුව සේ ආකෘතියක් භාවිතා කරන්න.

| අංකය | හවුල් ව්‍යාපාර | සීමිත පෞද්ගලික සමාගම් |
|---|---|---|
| A | | |
| B | | |
| C | | |
| D | | |

iii. සීමිත සමාගමක් ලියාපදිංචි කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කළයුතු ලියකියවිලි මොනවාද?

ආ. වරලත් ව්‍යාපාර සංවිධාන ක්‍රමය, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තවමත් නැවුම් අත්දැකීමක් ගෙනදෙන්නකි.

iv. වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙක කවරේද?

v. "සෑම වරලත් ව්‍යාපාරයක්ම කේවල ස්වාමි ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වේ." ඔබ මීට එකඟවේද? විමසන්න.

(ලකුණු 2 x 5 = 10යි)

(06) අ. ඕනෑම සාර්ථක ව්‍යවසායකයෙකු පිටුපස සෙවනැල්ලක් මෙන්, ක්‍රියාකාරී ව්‍යාපාර සැළසුමක් පවතී.
i. ව්‍යවසායකයෙකුට, ව්‍යාපාර සැළසුමක් අවශ්‍යවීමට හේතු සාධක **හතරක්** නම් කරන්න.
ii. අලෙවි සැළසුමෙහි, අලෙවි උපාය මාර්ග තේරීමේදී අලෙවි මිශ්‍රයෙහි අඩංගු විචල්‍යයන් මොනවාද?
iii. මැටි, ගඩොල් නිෂ්පාදනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ඇඳ පැහැදිලි කරන්න.

ආ. ව්‍යාපාර සැළසුමක් තුළ මූල්‍ය සැළසුමට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි.
iv. ව්‍යවසායකයෙකුට මූල්‍ය සැළසුම මගින් අත්වන ප්‍රයෝජන මොනවාද?
v. "කාරක ප්‍රාග්ධනය" (Working Capital) යනු කුමක්ද? උදාහරණ **දෙකක්** සපයන්න.

(ලකුණු 2 x 5 = 10යි)

(07) අ. "නිර්මල" නමින් වෙසක්පත් මුද්‍රණාලයක් ආරම්භ කිරීමට නියමිත සංඛ, ඒ සඳහා සැකසූ ව්‍යාපාර සැළසුමෙන් උපුටා ගත් තොරතුරු කිහිපයක් ඔබවෙත ඉදිරිපත් කොට ඇත.

| | |
|---|---|
| මුද්‍රණ යන්ත්‍රය | රුː 2,500,000 |
| ගොඩනැගිලි ඉදිකිරීමේ සැළසුම් ඇඳීම | රුː 150,000 |
| විදුලිය ලබාගැනීම | රුː 30,000 |
| පරිගණක යන්ත්‍ර ගැනීම | රුː 45,000 |
| බෙදාහැරීමේ මෝටර් රථය | රුː 1,000,000 |

සටහන්
- මුද්‍රණාලය ස්ථාපිත කිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ වටිනාකම රුː 1,500,000 වන අතර එය සංඛ සතුවේ.
- මාසයක් පුරා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම පිණිස රුː 250,000 අවශ්‍ය වන බව තක්සේරු කොට ඇත. එය බැංකු ණයකින් සපුරාගෙන ඇත.
- බෙදාහැරීමේ මෝටර්රථය මිලට ගැනීමට, බැංකුවෙන් රුː 700,000 ණයක්, සංඛ ගෙන ඇත.

අවශ්‍ය වන්නේ
1. ව්‍යාපාරයේ මුළු ආයෝජන ඇස්තමේන්තුව

(ලකුණු 06යි)

ආ. අශානි, හෙළ බොජුන් හලේ පවත්වාගෙන යාමට අපේක්ෂා කරන "Mix Fruit" ව්‍යාපාරයේ පළමු කාර්තුවට නියමිත තොරතුරු කිහිපයක් පහත වේ.

| | |
|---|---|
| පළතුරු - අඹ | රුː 25,000 |
| - අන්නාසි | රුː 30,000 |
| - අලිගැටපේර | රුː 15,000 |
| සේවක වැටුප් | රුː 60,000 |
| විදුලි ගාස්තු | රුː 15,000 |
| දෙහි | රුː 2,500 |
| වරිපනම් ගාස්තු | රුː 3,000 |
| විකුණුම් ආදායම | රුː 250,000 |

සටහන
- පළතුරු මිශ්‍ර කිරීමේ යන්ත්‍රයේ වටිනාකම රුː 20,000කි එය 10% බැගින් වාර්ෂිකව ක්ෂය වේ.

අවශ්‍ය වන්නේ
Mix Fruit ව්‍යාපාරයේ පළමු කාර්තුවේ අපේක්ෂිත ශුද්ධ ලාභය/පාඩුව නිරූපිත ලේඛණය

(ලකුණු 04යි)
(මුළු ලකුණු 10යි)

## අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018
## ව්‍යවසායකත්ව අධ්‍යයනය - 11 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 1. 4 | 11. 4 | 21. 4 | 31. 3 |
| 2. 3 | 12. 2 | 22. 1 | 32. 3 |
| 3. 2 | 13. 2 | 23. 2 | 33. 2 |
| 4. 1 | 14. 3 | 24. 2 | 34. 4 |
| 5. 3 | 15. 1 | 25. 3 | 35. 2 |
| 6. 3 | 16. 4 | 26. 3 | 36. 2 |
| 7. 4 | 17. 4 | 27. 4 | 37. 3 |
| 8. 1 | 18. 1 | 28. 2 | 38. 1 |
| 9. 2 | 19. 2 | 29. 1 | 39. 1 |
| 10. 3 | 20. 3 | 30. 1 | 40. 3 |

(ලකුණු 1 x 40 = 40යි)

II කොටස

(1) i. 1. පළතුරු බීම සැකසීම. 2. පලතුරු යුෂ සැකසීම.

(කරුණු 2ට ලකුණු 02යි)

(වෙනත් නිෂ්පාදිතයක් ළමයා දැක්විය හැක.)

යක් ළමයා දැක්විය හැක.)

ii. 1. දෙමව්පියන්ගේ විශ්වාසය හා ආකල්ප 2. සෑම කාර්යකදීම ක්ෂණිකව ක්‍රියා කිරීම

(කරුණු 2ට ලකුණු 02යි)

iii. 1. මූල්‍ය - මහජන බැංකුව/ලංකා බැංකුව
2. තාක්ෂණ - කාර්මික සංවර්ධන මණ්ඩලය/කාර්මික තාක්ෂණ ආයතනය.

(එක් අංශයක ආයතනයකට ලකුණු 01 බැගින්, ලකුණු 02යි)

iv. ● ලද විදේශ අධ්‍යාපනය. ● ඔහු සතු නිර්මාණශීලී ගති ලක්ෂණය. ● පියුමි සමඟ විවාහ ගිවිස ගැනීම.

(කරුණු 2ට ලකුණු 02යි)

v. ● අඛණ්ඩ පැවැත්මක් හිමිවීම. ●නෛතික පුද්ගලභාවයක් හිමිවීම.
● වගකීම් සීමිත වීම. ●ඉහළ පිළිගැනීම.
● පවුලේ සාමාජිකයින් සම්බන්ධ කරගනිමින් සමාගම ඇරඹිය හැකිවීම.

(කරුණු 2ට ලකුණු 02යි)

| | | |
|---|---|---|
| vi. පළතුරු | 125,000 | |
| ප/සෑ/සේවක වැටුප් | 50,000 | (අයිතම නිවැරදි විය යුතුයි. නැතිනම් ලකුණු නැත.) (ලකුණු 02) |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 25,000 | |
| | 200,000 | |

| | | |
|---|---|---|
| vii. විදුලි ගාස්තු | 5,000 | |
| ජල ගාස්තු | 2,000 | (අයිතම හා වටිනාකම නිවැරදි විය යුතුයි.නැතිනම් ලකුණු නැත.) |
| ඇසුරුම් ද්‍රව්‍ය | 10,000 | (ලකුණු 02) |
| යන්ත්‍ර ක්ෂය | 2,000 | |
| | 19,000 | |

viii.නිෂ්පාදන පැකට් ගණන x විකුණුම් මිල
5000 x රු. 100
රු. 500,000/= (වටිනාකම පමණක් සෑහේ.) (ලකුණු 02)

| | | |
|---|---|---|
| ix. මුළු විකුණුම් ආදායම | රු. 500,000 | (ලකුණු 1/2) |
| (-) මුළු නිෂ්පාදන පිරිවැය | රු. 200,000 | (ලකුණු 1/2) |
| | 300,000 | (ලකුණු 1/2) |
| (-) මුළු නිෂ්පාදන නොවන පිරිවැය | රු. 19,000 | (ලකුණු 1/2) |
| ශුද්ධ ලාභය | රු. 281,000 | |
| | | (මුළු ලකුණු 02) |

| | | |
|---|---|---|
| x. ගොඩනැගිලි | රු. 500,000 | (ලකුණු 01) |
| යන්ත්‍ර | රු. 200,000 | (ලකුණු 01) |
| | රු. 700,000 | (වටිනාකමට ලකුණු දෙන්න.) |

(02) අ. i. ව්‍යවසායකයන්ට ම ආවේණික වූ විශේෂිත ගතිපැවතුම්, විශ්වාස, ආකල්ප, චාරිත්‍ර වාරිත්‍ර, සම්මතයන් මෙන්ම හැසිරීම් රටා ආදී අංගවලින් සැදුම්ලත් සංකල්පයකි.
(පිළිතුරේ ගුණාත්මක භාවය මත ලකුණු දෙන්න) (ලකුණු 02)

ii. 1. රටේ සේවා වියුක්තියට විසඳුමක් වීම. 2. රටේ ආර්ථික සංවර්ධනය වේගවත් වීම.
(කරුණු 2ක් නම් කිරීමට ලකුණු 01යි. එම කරුණු 02 විසඳුම් ලැබෙන අයුරු විස්තර කිරීමට ලකුණු 01යි. වෙනත් පිළිතුරු ද තිබේ.)

iii. 1. සීමිත සම්පත් ලබාගැනීමේ හැකියාව.
2. හිතකර හා ස්ථාවර දේශපාලන පරිසරයක් පැවතීම.
3. රාජ්‍ය හා වෙනත් අංශ වලින් ලැබෙන දිරි ගැන්වීම.
4. හිතකර ආර්ථික පසුබිමක් පැවතීම.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

අ. iv. 1. රූපලාවන්‍ය පහසුකම් සැපයීම.
2. පෙරපාසල් පවත්වාගෙන යාම.
3. විලාසිතා සහ මෝස්තර නිර්මාණය කිරීම.
4. විසිතුරු මල් වගා කිරීම.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

v. 1. පිරිමැසුම් සහිත බව. 3. දරාගැනීමේ හැකියාව.
2. ස්වයං විනය. 4. ඉහළ මට්ටමේ පවතින නිර්මාණශීලීභාවය.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත.)

(03) අ. i. • අවදානම් දැරීමට ඇති කැමැත්ත. • නිර්මාණශීලී බව.
• කැපවීම. • ආත්ම විශ්වාසය.
(කරුණු 04ට, 1/4 බැගින් ලකුණු 01යි. විස්තර කිරීමට ලකුණු 01යි.)

ii. සමස්ත ව්‍යාපාරයේම අනාගත ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම, ඊට අවශ්‍ය උපාය මාර්ග තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම ආදී කාර්යයන් කිරීමට ව්‍යවසායකයෙකුට ඇති හැකියාව.
(ලකුණු 01යි)
1. නිවැරදිව නව වෙළඳපල සොයා ගැනීම. 2.නිවැරදිව ව්‍යාපාර සැළසුම සැකසීම.
(උදාහරණ 02ට, 1/2 බැගින් ලකුණු 01යි.)

iii. • ස්වයං ඇගයීම. • පුහුණුව හා සංවර්ධනය. • අධ්‍යාපනය.
(කරුණු 02ට ලකුණු 02යි)

(ආ) iv. පරිසරයේ ඇති ගැටළුවකට විසඳුමක් වන පුද්ගලයින්ගේ අවශ්‍යතා සහ වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති පුද්ගලයකුගේ සිත තුළ හට ගන්නා මානසික සිතුවිල්ලකි.
(ලකුණු 02යි. පිළිතුරේ ගුණාත්මක භාවය මත ලකුණු දෙන්න.)

v. • අවශ්‍ය සම්පත් සපයාගත හැකිවීම. • ඉල්ලුමක් පැවතීම.
• තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදීමේ හැකියාව. • නීතිරීතිවලට අනුකූල වීම.
• ආකර්ශනීය ඉපැයුමක් තිබීම.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

(04) අ. i. • හිමිකරුවන් .• කළමනාකරුවන්. • සේවකයින්. • සම්පත්.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

ii. ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන ස්වභාවික සංසිද්ධීන් සමූහයෙන් සැදුම්ලත් පරිසරය.
(ලකුණු 01යි)
උදා :- ගංවතුර ගැලීම් නිසා නිවාස විනාශවීම.
(වැලි, සිමෙන්ති, ගඩොල් සැපයීම, වඩු කාර්මිකයින්, ගොඩනැගිලි ඉදිකිරීම් ආදී අවස්ථා උදාවීම.)
(ලකුණු 01යි)

iii. • තම ශක්තීන් හඳුනාගැනීමට.
• තම දුර්වලතා හඳුනාගැනීමට.
• පරිසරයේ පවතින ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීමට.
• පරිසර වෙනස් කම් වලට ගැළපෙන අයුරින් සැළසුම් සැකසීමට.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

ආ. iv. • කුඩා ප්‍රාග්ධනයකින් ව්‍යාපාරය ඇරඹීමේ පහසුව. • තම කුසලතා ව්‍යාපාරයට යෙදවිය හැකිවීම.

● වෙනස්වන පරිසරයට පහසුවෙන් ප්‍රතිචාර දැක්විය හැකිවීම.
● රාජ්‍ය හා වෙනත් අංශ වලින් ලැබෙන දිරිගැන්වීම.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

v. නැත. (ලකුණු 01යි)
● ව්‍යාපාරිකයාගේ පෞද්ගලික නමින් හැර, වෙනත් ව්‍යාජ නමකින් ව්‍යාපාරනාමය පවත්වාගෙන යන්නේ නම් පමණක් එම ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුයි.
(ලකුණු 01යි)

(05) අ. i. ● හවුල්කරුවන් ප්‍රාග්ධනය යොදන ප්‍රමාණය.
● හවුල්කරුවන් ලාභ/පාඩු බෙදාගන්නා ආකාරය.
● හවුල්කරුවන් ව්‍යාපාරයට සේවය කරන ආකාරය.
● කරන සේවය සඳහා හවුල්කරුවන්ට වැටුප් ගෙවන ආකාරය.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

ii.

| අංකය | හවුල් ව්‍යාපාර | සීමිත සමාගම් පනත |
|---|---|---|
| A | 02 | 01 |
| B | 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත | 2007 සමාගම් පනත |
| C | 20 | 50 |
| D | හවුල්කරුවන් මගින් | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් |

(පැති 02ම නිවැරදි විය යුතුය. කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි කරුණු 01 නම් ලකුණු නැත).

iii. ● සමාගමේ නම පිළිබඳ ප්‍රකාශනය.
● සාංගමික ව්‍යවස්ථාවලිය.
● අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කිරීමට, කැමති බවට ප්‍රකාශන.
● ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට, කැමති බවට ප්‍රකාශනය.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

iv. ● වරලත් හිමියා ● වරලත් ලාභියා
(කරුණු 02ට ලකුණු 02යි. කරුණු 01ට ලකුණු 01යි)

v. නැත (ලකුණු 01යි)
මේවා කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් ආදිය ලෙස සංවිධාන විය හැක.
(ලකුණු 01යි)

(06) අ. i. ● ව්‍යාපාර අදහස විස්තර කිරීමට.
● අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට.
● අවශ්‍ය සම්පත් සම්පාදනය කර ගැනීමට.
● වෙනස්වන ව්‍යාපාර පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

ii. ● නිෂ්පාදිතය. ● මිල. ● ස්ථානය. ● ප්‍රවර්ධනය.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

iii.

| යෙදවුම් ⟶ | පරිවර්තන ක්‍රියාවලිය ⟶ | නිමවුම් |
|---|---|---|
| මැටි | මැටි ඇණීම | ගඩොල් |
| වතුර | ගඩොල් කැපීම | |
| පෝරණුව/උදුන | වේලීම | |
| ගඩොල් අච්චුව | පෝරණුවේ ඇසිරීම | |
| ශ්‍රමය | පිළිස්සීම | |

(නිෂ්පාදන ක්‍රියාවලිය ඊතල සහිතව දැක්වීමට ලකුණු 1/2යි.)
(යෙදවුම් 03ක්වත් නම් කිරීමට ලකුණු 1/2යි.)
(පරිවර්තන ක්‍රියාවලියේ ක්‍රියාකාරකම් 03ක්වත් නම් කිරීමට ලකුණු 1/2යි.)
(නිමැවුම නිශ්චිතව නම් කිරීමට ලකුණු 1/2යි.)

iv. ● අවශ්‍ය අරමුදල් ප්‍රමාණය තීරණය කිරීමට.
● අරමුදල් සම්පාදන මාර්ග තීරණය කිරීමට.
● ව්‍යාපාර ප්‍රතිඵලය දැනගැනීමට.
● ඇතිවිය හැකි මූල්‍ය ගැටළු අවම කරගැනීමට.
(කරුණු 04ට, 1/2 බැගින් ලකුණු 02යි. කරුණු 2 - 3 නම් ලකුණු 01යි. කරුණු 01 නම් ලකුණු නැත).

v. ව්‍යාපාරයක් එදිනෙදා නඩත්තු කොට පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රාග්ධනය.
(ලකුණු 01යි)

උදා :- ● සේවක වැටුප් ගෙවීම. ● විදුලි බිල්පත් ගෙවීම.
(කරුණු 02ට ලකුණු 01යි. කරුණු 01ට ලකුණු නැත).

(07) අ.

"නිර්මල" වෙසක්පත් මුද්‍රණාලය
ආයෝජන ඇස්තමේන්තුව

| | යෝජිත ප්‍රාග්ධනය (රු.) | | මුළු ආයෝජනය (රු.) |
|---|---|---|---|
| | හිමිකරු | බැංකු ණය | |
| ස්ථාවර වත්කම් | | | |
| මුද්‍රණ යන්ත්‍රය | 2500,000 (½) | - | 2500,000 |
| පරිගණක යන්ත්‍ර | 45,000 (½) | - | 45,000 |
| බෙදාහැරීමේ මෝටර් රථය | 300,000 (½) | 700,000 (1/2) | 1000,000 |
| ගොඩනැගිල්ල | 1500,000 (½) | - | 1500,000 |
| මුළු ස්ථාවර වත්කම් | 4345,000 | 700,000 | 5045,000 (½) |
| ආරම්භ කිරීමට පෙර වියදම් | | | |
| ගොඩනැගිලි සැළසුම් | 150,000 (½) | - | 150,000 |
| විදුලිය ලබා ගැනීම | 30,000 (½) | - | 30,000 |
| ආරම්භ කිරීමට පෙර මුළු වියදම් | 180,000 | | 180,000 |
| කාරක ප්‍රාග්ධනය | | | |
| එදිනෙදා මෙහෙයුම් වියදම් | - | 250,000(½) | 250,000 (½) |
| මුළු කාරක ප්‍රාග්ධනය | - | 250,000 | 250,000 (½) |
| මුළු ආයෝජනය | 4525,000 | 950,000 | 5475,000 (½) |

(ලකුණු 06)

ආ.

Mix Fruit ව්‍යාපාරය
වසරේ පළමු කාර්තුව සඳහා අපේක්ෂිත ප්‍රතිඵල
ගණනය කිරීමේ ලේඛණය

| | (රුපියල්) | (රුපියල්) |
|---|---|---|
| විකුණුම් ආදායම | | 250,000 (½) |
| (-) නිෂ්පාදන පිරිවැය | | |
| පළතුරු - අඹ | 25,000 } (½) | |
| අන්නාසි | 30,000 } | |
| අලිගැටපේර | 15,000 | |
| දෙහි | 2,500 (½) | |
| සේවක වැටුප් | 60,000 (½) | |
| | | (132,500) |
| | | 117,500 |
| (-) නිෂ්පාදන නොවන පිරිවැය | | |
| විදුලි ගාස්තු | 15,000 (½) | |
| වරිපනම් ගාස්තු | 3,000 (½) | |
| යන්ත්‍ර ක්ෂය | 500 (½) | |
| | | (18,500) |
| ශුද්ධ ලාභය | | 99,000 (½) |

(ලකුණු 04)
(මුළු ලකුණු 10 යි)